වයඹ පළාත් සභාව

<u>වයඹ පළාත් සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම</u>

මුරකරු තනතුරු	-	05
කාර්යාල කාර්ය සහායක තනතුරු	-	12

වයඹ පළාත් සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ ඉහත සඳහන් තනතුරු වලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති වයස අවුරුදු 18 ත් 45 ත් අතර වයඹ පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම තනතුර ස්ථිරය / විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදි ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත්වේ.)

02. මසකට රු: 24250 – 250 x 10 – 270 x 10 - 300 x 10 – 330 x 12 – 36410
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 - PL-1) වැටුප් පරිමාණයක් මෙම තනතුරට අයත්ය.

03. සුදුසුකම් :

(අ) අධ්‍යාපන සුදුසුකම් :- අධ්‍යයන පොදු සහතික පත්‍ර.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුය.(වෛකල්පිත විෂයයන් හැර)

04. සෑම අයදුම්කරුවෙක්ම වයඹ පළාත තුල වසර 03 ක ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාල ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් සනාථ කළ යුතුය.)

05. බඳවා ගැනීමේ ක්‍රමය - තනතුරට අදාල ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ඉහලම ලකුණු අනුපිළිවෙල මත පුරප්පාඩු තනතුරු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

05.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදෙන ක්‍රමය:

මූලික අධ්‍යාපන සුදුසුකම් :-

1.1	අ.පො.ස.(සා.පෙළ) සාමාන්‍ය සාමාර්ථයක් සඳහා	ලකුණු 03	
1.2	අ.පො.ස.(සා.පෙළ) සම්මාන සාමාර්ථයක් සඳහා	ලකුණු 04	
1.3	අ.පො.ස.(සා.පෙළ) විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා	ලකුණු 05	
	(සා.පෙළ) විභාගයේ උපරිම වශයෙන් විෂයන් 6 ක් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.		**උපරිම ලකුණු 30**

05.2 සාමාන්‍ය දැනීම හා අවබෝධය සඳහා ප්‍රශ්ණාවලියක් මගින් තෝරාගත් ප්‍රශ්ණ 05 කට දෙනු ලබන පිළිතුරු අනුව **උපරිම ලකුණු 50**

05.3 පෞරුෂය සඳහා **උපරිම ලකුණු 20**

මුළු එකතුව ලකුණු 100

මෙම තනතුර සඳහා අයදුම් කරන්නන් මෙහි සඳහන් ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පිළියෙල කරගතයුතු අතර, එය 2017.04.12 වැනි දිනට හෝ එදිනට පෙර "ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය , වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් භාරදීමට හැකිය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අදාල තනතුර සඳහන් කල යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා නියමිත සුදුසුකම් සපුරා නොමැතිව එවන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එම්.ඒ.බී.වී.බණ්ඩාරනායක,
ප්‍රධාන ලේකම් (වැ.බ.) ,
වයඹ පළාත.

2017 මාර්තු මස 30 වැනි දින
ප්‍රධාන ලේකම් කාර්යාලයේ දී.